සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

14-02-2024

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Learning Resource Center 526

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 2යි |

නම / பெயர் / Name .............................................. විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

සැලකිය යුතුයි

- I කොටසේ ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.
- II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

---

## I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා දී ඇති වගන්ති හරිනම් (√) ලකුණද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

01. නිදහස් අධ්‍යාපනය ශ්‍රී ලංකාවට හඳුන්වාදීමේ ගෞරවය ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්.කන්නන්ගර මැතිතුමාට හිමි වේ. (..........)

02. මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීමත් සමඟ විදුලිය වර්තමාන සමාජයට අත්‍යාවශ්‍ය සේවාවක් වී ඇත. (..........)

03. ''එකා සැමටත් සැම එකාටත්'' ශ්‍රී ලංකා පොලීසියේ ආදර්ශ පාඨයයි. (..........)

04. සාකච්ඡා මඟින් තීරණ වලට එළඹීම පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයකි. (..........)

05. බැනවැදීම, පහර දීම, දෙතොල් අතපය වෙව්ලීම සතුටක් ඇති වන විට සිදු වන ප්‍රතික්‍රියාවකි. (..........)

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වලට හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

06. මානව හිතවාදීව කටයුතු කිරීම .............................................. නායකත්ව ගුණාංගයකි.

07. සෑම ජන වර්ගයක්ම පුද්ගල .............................................. ආරක්ෂා කිරීම බහු සංස්කෘතික ජන සමාජයක පුරවැසියන් සතු ගුණාංගයකි.

08. තෛපොංගල් උත්සවය හින්දු ආගම හා බැඳුණු .............................................. උත්සවයකි.

09. අප සියලු දෙනාටම සුවිශේෂී වූ සංස්කෘතියක් ඇත. එය සංස්කෘතික .............................................. යි.

10. නියගයෙන් .............................................. වීමට ගස්වැල් සිටුවීම හා වන වගාව ඇති කළ යුතුය.

(සංස්කෘතික, ප්‍රජාතන්ත්‍රවාදී, අයිතිවාසිකම්, ඒකාධිපතිවාදී, ආගමික, ආරක්ෂා, අනන්‍යතාවය)

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. ඖෂධ භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණකි,
    1. වේදනා සහිත වේලාවල බෙහෙත් බීම.
    2. තමන්ට නිසි පරිදි බෙහෙත් බීම.
    3. ඖෂධ වල නියමිත මාත්‍රාව භාවිත කිරීම.
    4. වෙනත් රෝගියෙකුගේ බෙහෙත් භාවිතා කිරීම.

12. හදිසි අවස්ථාවක දී ගිනි නිවීම් හා ගිලන් රථ සේවාවක සහාය ලබා ගැනීමට ඔබ විසින් ඇමතිය යුතු දුරකථන අංකය කුමක් ද?
    1. 110.
    2. 1969.
    3. 118.
    4. 119.

13. ජීවිත අභියෝග ජය ගැනීමට ප්‍රගුණ කළ යුතු මනෝ සමාජීය නිපුණතාවය වන්නේ,
    1. ගැටලුවලින් මඟ හැරීම.
    2. අන්තර් පුද්ගල සම්බන්ධතා ඇති කර ගැනීම.
    3. අභියෝග වලට මුහුණ නොදීම.
    4. අන්අයගේ රැකවරණය සොයා යාම.

14. විදුලිය ප්‍රයෝජනයට ගන්නා පුරවැසියකු විසින් ඉටු නොකළ යුතු ක්‍රියාවක් වන්නේ,
    1. විදුලිය අරපිරිමැස්මෙන් භාවිත කිරීම.
    2. අයථා ක්‍රමවලින් විදුලිය පරිභෝජනය කිරීම.
    3. බිල්පත් නියමිත කාලයට ගෙවීම.
    4. විදුලි සැපයුමට සම්බන්ධ උපකරණ ආරක්ෂා කිරීම.

15. ශ්‍රී ලංකාවේ පිත්තල බඩු කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශයකි.
    1. වේවැල්දෙණිය.
    2. මොළගොඩ.
    3. අම්බලන්ගොඩ.
    4. පිළිමතලාව.

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට අදාළ නිවැරදි පිළිතුර සහිත ඉංග්‍රීසි අක්ෂරය තෝරා වරහන තුළ ලියන්න.

| | | | |
|---|---|---|---|
| 16. | ශ්‍රම අභිමානයෙන් කටයුතු කිරීම | ( ) | A. රිය අනතුරු |
| 17. | වෘත්තීය පුහුණුව ලබා දෙන ආයතනයකි | ( ) | B. සේවය තෘප්තිමත් වීමට හේතු වේ. |
| 18. | සේවාදායකයා ප්‍රගුණ කර ගත යුතු ගුණාංගයකි | ( ) | C. අවධානයෙන් පාඩමට සම්බන්ධ වීම. |
| 19. | මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන විපතකි | ( ) | D. ජාතික තරුණ සේවා සභාව |
| 20. | විෂය සාධනය දුර්වල සිසුවෙකු විසින් ගත යුතු ක්‍රියාමාර්ගයකි | ( ) | E. යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා පවත්වා ගැනීම. |

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- අනිකුත් ප්‍රශ්න අතුරින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

---

01) i. මෙරට බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ පොදු සේවා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ළමයෙකු සතු අයිතිවාසිකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

iii. බහු සංස්කෘතික සමාජ පවතින රටවල් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

iv. අනතුරු හා ආපදාවලදී සහය ලබා ගත හැකි ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

v. පාසල් සිසුන් මුහුණ දෙන ගැටලු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

vi. වැඩ ලෝකයේ රැකියා බෙදනු ලබන ක්ෂේත්‍ර තුනෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

vii. ශ්‍රමය බෙදනු ලබන ප්‍රධාන කොටස් දෙක ලියා දක්වන්න. (ලකුණු 02)

viii. ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන සමුපකාර සමිති වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

02) i. පොදු සේවා වර්ග කළ හැකි ආකාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. පොදු සේවාවල පොදු ලක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii. විදුලිය ප්‍රයෝජනයට ගන්නා පුරවැසියකු විසින් ඉටුකළ යුතු යුතුකම් පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

03) i. පවුල තුළ දැකගත හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ළමා අයිතිවාසිකම් බෙදා ඇති ප්‍රධාන තේමා හතර සඳහන් කරන්න. (ලකුණු 04)

iii. අයහපත් චිත්තවේග සමනය කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04) i. හින්දු ආගම හා බැඳුණු සංස්කෘතික උත්සව දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. බහු සංස්කෘතික සමාජයක් ලෙස ඇමරිකා එක්සත් ජනපදය කටයුතු කිරීම සඳහා අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

iii. ජාතික සමගිය හා තිරසර සාමය ගොඩනගා ගැනීමේ වාසි තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

05) i. වර්තමානයේ මුහුණ පෑමට සිදුව ඇති ස්වාභාවික විපත් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. මාර්ග අනතුරු සිදුවීමට බලපාන මූලික හේතු හතරක් සඳහන් කරන්න. ලකුණු 04)

iii. තිරසර සංවර්ධනයේ දී අප සියලු දෙනා සැලකිලිමත්විය යුතු කරුණු පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

06) i. ගැටලුවක් විසඳීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

ii. අභියෝග ජයගැනීමට ප්‍රගුණ කළ යුතු මනෝ සමාජීය නිපුණතා හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ගැටලු හා අභියෝග ජීවිත සාර්ථකත්වයට අදාළ කර ගත හැකි ආකාරය කරුණු තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

07) i. කය වෙහෙසා කරන රැකියාවක් හා මනස වෙහෙසා කරන රැකියාවක් නම් කරන්න. (ලකුණු 02)

ii. වැඩ ලෝකය ජය ගැනීම සඳහා වෘත්තීය පුහුණුව ලබා දෙන ආයතන හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

iii. සේවකයෙකු සතු අයිතිවාසිකම් පහක් සඳහන් කරන්න. (ලකුණු 05)